## 2022 වර්ෂයේ අහිමි වූ කාලය සඳහා ප්‍රතිසාධන සැලැස්ම

## (Recovery Plan for Learning Loss – 2022)

(7 ශ්‍රේණියේ පළමු වාරයේ කාලච්ඡේද 13ක් ද දෙවන හා තෙවන වාරවල කාලච්ඡේද 18ක් ද බැගින් කාලච්ඡේද 49ක් සඳහා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය පවත්වාගෙන යාමට මෙම සැලැස්ම සකස් කර ඇත.)

# නාට්‍ය හා රංග කලාව

## 7 ශ්‍රේණිය- දෙවන වාරය

සෞන්දර්ය අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම
www.nie.lk

| නිපුණතාවය | නිපුණතා මට්ටම | ඉගෙනුම් පල | විෂය අන්තර්ගතය | ක්‍රියාකාරකම | කාලච්ඡේද |
|---|---|---|---|---|---|
| **7 ශ්‍රේණිය දෙවන වාරයෙන් තෝරා ගත් ඉගෙනුම් පල සහ පාඩම්** | | | | | |
| 1. නාට්‍ය හා රංග කලාව පිළිබඳ සිද්ධාන්ත පැහැදිළි කරයි. | 1.4 ජනමාධ්‍යය ඇසුරෙන් විකාශනය වන වේදිකා නාට්‍ය නිර්මාණ පිළිබඳ අදහස් ප්‍රකාශ කරයි. | ▪ විද්‍යුත් මාධ්‍ය මගින් නිරූපිත නාට්‍ය (වර්ග) ප්‍රභේද නම් කරයි.<br>▪ වේදිකා නාට්‍යයක් හා රූපවාහිනී නාට්‍යයක් අතර ඇති වෙනස්කම් නම් කරයි. | ▪ විද්‍යුත් මාධ්‍ය මගින් නිරූපිත නාට්‍ය වර්ග සහ වේදිකා නාට්‍ය අතර ඇති මූලික වෙනස්කම් සලකා බැලීම. | 1.4 - විද්‍යුත් මාධ්‍යයෙන් දකින වේදිකා නාට්‍ය | 01 |
| | 1.6 සත්ත්ව හා මිනිස් චර්යාවන් අනුකරණය කරයි. | ▪ මිනිස් හැසිරීම නිරීක්ෂණය කරයි.<br>▪ සත්ව චර්යා කෙරෙහි විමසිලිමත් වෙයි.<br>▪ වයස හා අවස්ථා අනුව චර්යා විධි වෙනස් වන බව ප්‍රකාශ කරයි. | ▪ විවිධ මිනිස් හැසිරීම්. සත්ව චර්යා පිළිබඳව වයස හා අවස්ථා අනුව අනුකරණය කර පෙන්වීම. | 1.6 - මිනිස් හා සත්ව චර්යා අනුකරණය කිරීම | 01 |
| 2. ස්වකීය පරිකල්පනය මෙහෙයවා පරිසරය ආශ්‍රිත අත්දැකීම් පාදක කොටගෙන නිර්මාණකරණ යෙහි යෙදෙයි. | 2.4 ක්ෂණික නිරූපණයනහි යෙදෙයි. | ▪ ක්ෂණිකව අවබෝධ කරගැනීමේ ශක්තිය ලබා ගනියි.<br>▪ ක්ෂණික නිරූපණයේ යෙදෙයි. | ▪ ක්ෂණික නිරූපණය යනු කුමක්දැයි වටහා ගනිමින් විවිධ වූ මාතෘකා යටතේ ක්ෂණික නිරූපණය කිරීම. | 2.4 - ඇසූ සැණින් රගමු. | 01 |
| | 2.5 පරිකල්පනය වර්ධනය වන ක්‍රියාකාරකම්හි යෙදෙයි. | ▪ පරිකල්පනය යනු කුමක්දැයි ප්‍රකාශ කරයි.<br>▪ පරිකල්පන අභ්‍යාසවල යෙදෙයි. | ▪ පරිකල්පනය යනු කුමක්දැයි අවබෝධ කර ගනිමින් විවිධ වූ පරිකල්පනාත්මක ක්‍රියාකාරකම්හි යෙදීම. | 2.5 - පරිකල්පන අභ්‍යාසයන්හි යෙදීම. | 01 |
| | 2.6 සාමූහික ව කතාන්දර ගොතයි. | ▪ අවස්ථානුකූලව උචිත පරිදි කතාවක් ඉදිරිපත් කරයි.<br>▪ නිර්මාණාත්මකව කතාව ගොතයි.<br>▪ සාර්ථක කතන්දරයක මූලික ලක්ෂණ දක්වයි. | ▪ සිසුන් සාමූහිකව එකතු වී කතන්දරයක් නිර්මාණය කර දැක්වීම සහ කතන්දරයක සාර්ථකත්වයට හේතුවන මූලික ලක්ෂණ විමසා බැලීම. | 2.6.1 - කතා ගොතමු - ගොතා කියමු, | 02 |

| | | | | | |
|---|---|---|---|---|---|
| 3. නාට්‍ය හා රංග කලාවේ සිද්ධාන්ත අනුගමනය කරමින් ප්‍රායෝගික ක්‍රියාකාරකම්හි නියැළෙයි.. | 3.3 චරිතවලට ගැළපෙන පරිදි ක්‍රියාකාරකම්හි යෙදෙයි. | ▪ නාට්‍ය ගීත ගායනා කරයි.<br>▪ නාටය ගීත පිළිබඳව දැනුමක් ලබයි.<br>▪ නාට්‍ය ගීත වලට අදාළව රංගනය කරයි. | ▪ නාට්‍ය ගීත ගායනා කරමින් රංගනයේ යෙදිම. | 3.3.2 - නාට්‍ය ගීත ගයමින් රංගනය | 02 |
| | 3.4 නාට්‍ය හා රංග කලාවට අදාළ හඬ අභ්‍යාසවල යෙදේ. | ▪ විවිද නාද අනුකරනය කිරීමට පෙළඹෙයි.<br>▪ විවිධ අවස්ථාවල පරිසරයේ ඇති විවිධ නාද හඳුනා ගනියි.<br>▪ නාටයමය අවස්ථා නිරූපණය සඳහා විවිධ නාද යොදා ගැනීමට පෙළඹෙයි. | ▪ විවිධ නාද ඇසීම, එම නාද අනුකරණය කිරීම,ඒවා නාටයවලට යොදා ගත හැකි ආකාරය වටහා ගැනීම. | 3.4.1 - විවිද නාද අනුකරනය කරමු. | 01 |
| | | ▪ විවිධ ග්‍රාම නාමයන් නිවැරදිව උච්චාරණය කරයි.<br>▪ නම්පොත කියවීමේදී එහි ඇති රිද්මයන් භාවිත කරයි.<br>▪ එහි වචන විවිධාකාරයට උච්චාරණය කිරීමට පෙළඹෙයි. | ▪ නම්පොතෙහි එන විවිධ ග්‍රාම නාමයන් නිවැරදිව උච්චාරණය කිරීම සහ එහි එන රිද්මයන් හඳුනා ගනිමින් කටහඬ පැහැදිලිව භාවිත කිසාමේ පුහුණුව ලැබීම. | 3.4.2 - නම් පොත ආශ්‍රය කර ගනිමින් හඬ අභ්‍යාසවල යෙදීම. | 01 |
| | 3.5 රංග අභ්‍යාසවල නිරත වෙයි. | ▪ ශරීරය උණුසුම් කර ගැනීම සහ ශිථිලකරණය මගින් ශරීරය සැහැල්ලු කර ගනියි.<br>▪ මෙම රංග අභ්‍යාසයන්හි වැදගත්කම අවබෝධ කර ගනියි. | ▪ ශරීරය උණුසුම් කර ගැනීමේ රංග අභ්‍යාසයන්හි සහ ශිථිලකරණ රංග අභ්‍යාසයන්හි යෙදීම. | 3.5.1 - ශරීරය උණුසුම් කිරීමේ සහ ශිථිලකරණ අභ්‍යාසවල යෙදීම. | 02 |
| 4. නාට්‍ය හා රංග කලාවට සම්බන්ධ ශ්‍රී ලාංකේය සංස්කෘතියේ ඓතිහාසික පසුබිම පැහැදිළි කරයි. | 4.2 ඓතිහාසික කතා ආශ්‍රිත ක්‍රියාකාරකම්වල නිරත වෙයි | ▪ නාට්‍ය නිර්මාණය සඳහා යොදා ගතහැකි ඉතිහාස කතා නම් කරයි.<br>▪ ඉතිහාස කතා ඇසුරින් තෝරාගත් කෙටි නාට්‍යාවස්ථාවක් සැලසුම් කිරීම.<br>▪ ඉතිහාස කතා පාදක කොට නිර්මිත නාට්‍ය හා විවිධ කලා නිර්මාණ ලැයිස්තු ගත කරයි. | ▪ ශ්‍රී ලංකාවට ආවේණික ඓතිහාසික කතා නිර්මාණකරණය සඳහා භාවිත කළ හැකි ආකාරය විමසීම. | 4.2 ඉතිහාස කතා නාට්‍යයට. | 03 |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | | |
| | 4.3 දේශය පිළිබඳ ඇල්ම හා කැපවීම ප්‍රකට වන අයුරින් සමාජ, සංස්කෘතික තොරතුරු විමසයි. | ▪ ඓතිහාසික කතා පුවත් හා බැඳුණු වීර චරිත නම් කරයි.<br>▪ එම චරිත ,සිද්ධි හා අවස්ථා නිරූපණය කරයි. | ▪ ඓතිහාසික කතා හා බැඳුණු චරිත ,සිද්ධි හඳුනාගනිමින් ඒවා නාට්‍යානුසාරයෙන් නිරූපණය කිරීමට යොමු කිරීම සහ එම චරිතවල ඇති යහපත් ගුණාංග සිසුන්ට අවබෝධ කිරීම. | 4.3 රටට හිතැති චරිත හොයමු. | 01 |
| | 4.4 සංස්කෘතික හා සාමාජික වටිනාකම් සහිත තේමා රැගත් නාට්‍යමය අවස්ථා නිර්මාණය කරයි. | ▪ දේශීය සංස්කෘතිය විසින් අගය කරනු ලබන යහපත් සිරිත් අධ්‍යයනය කරයි.<br>▪ හොඳ සිරිත් ප්‍රකට කරවන නාට්‍යෝචිත අවස්ථා සිරිත් මල්දම ඇසුරෙන් සොයයි.<br>▪ යහපත් සිරිත් අගය කරයි. | ▪ සිරිත් මල්දම කෘතිය හඳුනා ගනිමින් ගායනා කරමින් එයින් ප්‍රකාශිත සාරධර්ම වටහා ගැනීම සහ එම පද්‍යවල ඇති නාට්‍යමය අවස්ථා හඳුනා ගැනීම. | 4.4 සිරිත් රකිමු - රුගුම් රඟමු | 02 |